# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE


මහලේකම් කාර්යාලය, කොළඹ 01.
ශ්‍රී ලංකාව

செயலகம், கொழும்பு 01.
இலங்கை

The Secretariat, Colombo 01.
Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700

ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823

වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: TIP/SS/01/03

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2019.11.13

**වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක : 1/2018 (4)**

ජනාධිපති ලේකම්
අග්‍රාමාත්‍ය ලේකම්
අමාත්‍ය මණ්ඩල ලේකම්
අමාත්‍යාංශ ලේකම්වරුන්
කොමිෂන් සභා ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්

**සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබා දීමේ යෝජනා ක්‍රමය**

සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීමේදී බලපත්‍ර දෙකක් අතර කාලය සලකා බැලීම සඳහා මේ වන විට පදනම් කර ගනු ලබන "ණයවර ලිපිය විවෘත කල / දේශීය එකලස් කරන ලද වාහනයක් සඳහා පළමු ගෙවීම සිදු කල දිනය" වෙනුවට බලපත්‍රය සඳහා යොමු කල අයදුම්පත අමාත්‍යාංශ ලේකම් / අදාල බලධාරියා විසින් අත්සන් කරන ලද දිනය යොදා ගැනීමට 2019.06.25 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත.

02. ඒ අනුව 2015.11.21 දින සිට ක්‍රියාත්මක වන පරිදි "ණයවර ලිපිය විවෘත කල / දේශීය එකලස් කරන ලද වාහනයක් සඳහා පලමු ගෙවීම සිදු කල දිනය" වෙනුවට "බලපත්‍රය සඳහා යොමු කල අයදුම්පත අමාත්‍යාංශ ලේකම් / අදාල බලධාරියා විසින් අත්සන් කරන ලද දිනය" යන විධිවිධානය ඇතුලත් කර වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛය සංශෝධනය කරමි.

03. 8.2.vi වශයෙන් පහත වගන්තිය ඇතුලත් කරනු ලැබේ.
"8.2.vi ඉහත පරිදි ඉදිරිපත් කරනු ලබන අයදුම් පත්‍රය, බලපත්‍රය නිකුත් කිරීම සඳහා බලය ලබා දී ඇති ආයතනයේ බලධාරියා විසින් අනුමත කිරීමෙන් පසුව එහි ඡායා පිටපතක් අදාල නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුවට ඇතුලත් කල යුතුය".

04. ඉහත චක්‍රලේඛයෙහි සඳහන් අනෙකුත් සියළු විධිවිධානයන් නොවෙනස්ව පවතී.

05. 2019.07.08 දිනැති අංක 1/2018 (3) දරන වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛය මෙමගින් අහෝසි කරමි.

**ආර්.එච්.එස්. සමරතුංග**
මහා භාණ්ඩාගාරයේ ලේකම් හා මුදල් අමාත්‍යාංශයේ ලේකම්

පිටපත් :

| | | |
|---|---|---|
| 01. | විගණකාධිපති | - අ.ක.ස |
| 02. | මහ බැංකුවේ අධිපති | - අ.ක.ස |
| 03. | අධ්‍යක්ෂ ජනරාල්, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති | - ඉහත පරිදි කටයුතු කිරීම සඳහා |
| 04. | අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති | - අ.ක.ස |
| 05. | අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගුව | - අ.ක.ස |
| 06. | අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා | - අ.ක.ස |
| 07. | අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර | - අ.ක.ස |
| 08. | කොමසාරිස් ජනරාල්, මෝටර් රථ ප්‍රවාහන | - අ.ක.ස |
| 09. | කොමසාරිස් ජනරාල්, දේශීය ආදායම් | - අ.ක.ස. |
| 10. | අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ විගණන | - අ.ක.ස. |